**ඇමුණුම 01**

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව

## අ.පො.ස.(උ.පෙළ) විභාගයේ - 2023(2024) ප්‍රායෝගික පරීක්ෂණ පරීක්ෂකවරුන් තෝරා ගැනීමේ අයදුම්පත්‍රය මාර්ගගත (online) ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

01. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී ඔබ විසින් සත්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කළ හොත් දීර්ඝ කාලීනව විභාග රාජකාරි තහනමකට ලක් කිරීමට ඉඩ ඇත.

02. ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩල සඳහා අයදුම් කරන නිලධාරියකුගේ පවුලේ සාමාජිකයකු, පදිංචි නිවසේ සිටින නේවාසිකයකු උක්ත විභාගයේ එම ප්‍රායෝගික පරීක්ෂණ විෂය සඳහා පෙනී සිටින්නේ නම් එවැනි නිලධාරියකු මෙම පරීක්ෂණ මණ්ඩල සඳහා අයදුම් **නොකළ** යුතුයි.

03. යම් නිලධාරියකු එම ප්‍රායෝගික විෂය සඳහා ප්‍රසිද්ධ උපකාරක පන්ති පවත්වන්නේ නම් ඔහු / ඇය පරීක්ෂණ මණ්ඩලයේ තනතුරක් දැරීමට සුදුසු **නොවන** හෙයින් අයදුම් **නොකළ** යුතුයි. ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩල සදහා අයදුම් පත් යොමු කළ හැකි වනුයේ රජයේ හෝ රජයේ අනුමත පෞද්ගලික පාසලක ස්ථිර ගුරුවරයෙකුට පමණි.

04. මාර්ගගතව අයදුම් කිරීමට පහත දැක්වෙන ඕනෑම ක්‍රමයක් අනුගමනය කළ හැක.
අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ,

- ✶ නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත (Click) කර ඉන්පසු " G.C.E.(A/L) - Examination 2023(2024) Obtaining Information to Select Examiners for the Practical Tests " මත (Click) කිරීම මගින් හෝ
- ✶ නිල ජංගම දුරකථන යෙදවුම (mobile application) වන "DoE" වෙත පිවිස "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත (Click) කර ඉන්පසු "G.C.E.(A/L) 2023(2024) Obtaining Information to Select Examiners for the Practical Tests" (online applications - school exams) මත (Click) කිරීම මගින් හෝ
- ✶ https://onlineexams.gov.lk/eic වෙත පිවිසීමෙන් පසු ලැබෙන ප්‍රවේශ කවුළුවේ, "Personal Account Login" හරහා පද්ධතියට ප්‍රවේශ වන්න.

05. එහි **තරු (*) ලකුණින්** දක්වා ඇති කොටස් අනිවාර්යයෙන්ම සම්පූර්ණ කළ යුතු අතර අනෙකුත් කොටස් ද තමන්ට අදාළ වන පරිදි සම්පූර්ණ කළ යුතුය.

06. මාර්ගගත ආකාරයට අයදුම් පත්‍රයේ පළමු පිටුව සම්පූර්ණ කිරීමේදී, තම **ජංගම දුරකථන අංකයට** අතිරේකව **WhatsApp අංකයක්** හා ස්ථාවර දුරකථන අංකයක් (ඇත්නම්) ඇතුළත් කරන්න. නොමැති නම් ඔබගේ වෙනත් ජංගම දුරකථන අංකයක් ඇතුලත් කරන්න.

07. වෙබ් පිටු අතර මාරුවීමට "Back" හෝ "Next" අයිකනය භාවිත කරන්න. ඔබ ඉල්ලා සිටින දිස්ත්‍රික්කවලට අමතරව දිවයිනේ වෙනත් ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමට **කැමති ද නැද්ද යන්න පිළිබඳව මනා අවබෝධයකින් යුතුව** සම්පූර්ණ කරන්න.

08. අයදුම්පත්‍රයේ සියලුම කොටස් සම්පූර්ණ කර "Submit" අයිකනය click කිරීමෙන් පසු ඔබගේ අයදුම්පත්‍රය PDF ආකාරයට බාගත (Download) කර ගත හැකි වේ. එම අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපතක් (Printout) ඔබ විසින් ලබා ගත යුතුය. "Submit" නොවීමට ප්‍රධානතම හේතුව ඔබ විසින් **තරු (*) ලකුණින්** දක්වා ඇති කොටස් නිසි පරිදි සම්පූර්ණ **නොකිරීම** නිසා විය හැකි බැවින් නැවත පෙර පිටු පරීක්ෂා කර බලන්න.

09. එම මුද්‍රිත පිටපතේ අංක **13 කොටස (කාලසටහන)** අත් අකුරින් සම්පූර්ණ කර ආයතන ප්‍රධානියා / විදුහල්පතිවරයා මඟින් සහතික කරවා ගෙන ඔහුට / ඇයට භාර දිය යුතුය.

10. ඔබ **ප්‍රධාන** හෝ **සහකාර පරීක්ෂකවරයෙකු** ලෙස මින් පෙර කටයුතු කර ඇත්නම් සේවය කර ඇති වසර ගණන අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය. එසේ **නොකිරීමෙන්** පරීක්ෂකවරු තෝරා ගැනීමේ දී ඔබට **අවාසිදායක** විය හැකිය.

11. **නියමිත පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

12. අදාළ ආයතනයේ ප්‍රධානියා / විදුහල්පතිවරයා විසින් අංක **15 කොටස** සම්පූර්ණ කිරීමෙන් පසු අයදුම්පත්‍ර සියල්ල එකම කවරයක බහා 2024.02.02 වන සිකුරාදා දිනට ප්‍රථම පහත ලිපිනයට යොමු කරන්න.

නන

**විභාග කොමසාරිස් ජනරාල්,**
**පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**පැලවත්ත, බත්තරමුල්ල.**

13. ලිපිනය ලියූ කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි **"2023(2024) අ.පො.ස.(උ.පෙළ) ප්‍රායෝගික පරීක්ෂණ"** යනුවෙන් සඳහන් කරන්න.

14. ඔබට අමතර වශයෙන් උපදෙස් අවශ්‍ය වුවහොත් පහත දුරකථන අංක මගින් **පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව** අමතන්න.

දුරකථන අංක ඃ 0112784208/0112784537